| 1402 තැපැල් හා සන්නිවේදන | | | 17,400,000 | 17,850,000 | (450,000) | -3 | වැඩසටහන් අංක 02 හි හිඟ දීමනා ගෙවීමට ප්‍රතිපාදන මාරු කිරීම |
| 1403 විදුලිය හා ජලය | | | 18,300,000 | 16,254,000 | 2,046,000 | 11 | වැඩසටහන් අංක 01 හා වැඩසටහන් අංක 03 හි හිඟ අතිකාල ගෙවීමට හා ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් පියවීම සඳහා ප්‍රතිපාදන මාරු කිරීම |
| 1407 ආරක්ෂක සේවා | | | 11,000,000 | 10,500,000 | 500,000 | 5 | වැඩසටහන් අංක 03 හි හිඟ අතිකාල ගෙවීමට ප්‍රතිපාදන මාරු කිරීම |
| **මාරුකිරීම්** | | | | | | | |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | | | 8,088,000 | 7,711,000 | 377,000 | 5 | වැඩසටහන් අංක 02 හා 01 හි හිඟ අතිකාල හා හිඟ දේපළ ණය පොලී ගෙවීමට ප්‍රතිපාදන ලබා ගැනීම |
| 1701 පාඩු සහ කපාහැරීම් | | | | 50,000 | (50,000) | -100 | බොල්ණය කපාහැරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම |
| මූලධන වියදම්<br>**මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | | | |
| 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | | - | 2,125,100 | (2,125,100) | -100 | මහියංගන ප්‍රා.ලේ. කාර්යාලයීය නව ගොඩනැගිල්ලේ බිල්පත් අංක 3 ගෙවීම සඳහා ඇස්තමේන්තු ගත කල නමුත් ප්‍රතිපාදන නොලැබීම නිසා වැඩසටහන් අංක 01 1003 ප්‍රතිපාදන මාරු කිරීම |
| **වෙනත් මූලධන වියදම්** | | | | | | | |
| 2509 වෙනත් | | | - | 157,000,000 | (157,000,000) | -100 | පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන ලබීම |

...............................................
ප්‍රධාන ගණකාධිකාරී
එච්.එම්. අනූෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat

14

ඊසීඒ- 2(iv)

## වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල
වියදම් ශීර්ෂ අංකය : 276

| මූල්‍යකරණය | | වැඩසටහන 01* | | වැඩසටහන 02* | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය ** 1 | සත්‍ය වියදම 2 | ශුද්ධ ප්‍රතිපාදනය ** 3 | සත්‍ය වියදම 4 | ශුද්ධ ප්‍රතිපාදනය ** 5 | සත්‍ය වියදම 6 | වියදමේ ප්‍රතිශතය *** (6÷5)X100 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 2,523,000,000 | 2,434,520,803 | | | 2,523,000,000 | 2,434,520,803 | 96 |
| 12 | විදේශ ණය | | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| 17 | විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය | | | | | | | |
| 18 | විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | |
| | එකතුව | | | | | | | |

* ඊසීඒ- 2 (v) අනුව එක් එක් වැඩසටහන් යටතේ ඇති අගයන් ඇතුළත් කරන්න
** ඊසීඒ- 2 හි 4 වන තීරුවට යොමුගත ප්‍රතිපාදන
*** දශමස්ථාන රහිතව % සඳහන් කරන්න

...........................................
ප්‍රධාන ගණකාධිකාරී
එච්.එම්. අනූෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

## <u>එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය</u>

(වැඩසටහනක ව්‍යාපෘති අනුව මූලධන වියදම් හා පුනරාවර්තන වියදම්වල මූල්‍යකරණය)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල
වියදම් ශීර්ෂ අංකය : 276

| | මූල්‍යකරණය | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | ව්‍යාපෘති 3 | | වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව* | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 1,209,000,000 | 1,159,152,881 | 928,000,000 | 899,252,436 | 389,000,000 | 376,078,297 | 2,526,000,000 | 2,434,483,614 |
| 12 | විදේශ ණය | | | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | | |
| 17 | විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය | | | | | | | | |
| 18 | විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | | |
| | එකතුව | | | | | | | | |

*වැඩසටහනක් වෙනුවෙන් අතිරේක පිටු එකතු කරන්නේ නම් අවසාන පිටුවේ එකතුව මුළු වැඩසටහනේ එකතුව විය යුතු ය.

H Inusha
.....................................
ප්‍රධාන ගණකාධිකාරි
එච්.එම්. අනුෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

# 2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල
වියදම් ශීර්ෂ අංකය : 276

රු.

| අග්‍රිම ගිණුම් අංකය | 2025 ජනවාරි 01 දිනට අග්‍රිම 1 | | | අග්‍රිම ලැබීම් 2 | | | අග්‍රිම පියවීම 3 | | | 2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4 | | | 2025 දෙසැම්බර් 31 | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොපිය වූ උප අග්‍රිම | නොපිය වූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර) | එකතුව | භාණ්ඩාගාරයෙන් | වෙනත් මූලාශ්‍රවලින් | එකතුව | වියදම් මගින් | මුදල් මගින් | එකතුව | නොපිය වූ උප අග්‍රිම ශේෂය | නොපිය වූ අග්‍රිම ශේෂය | එකතුව | *5 | 6 |
| | 1(i) | 1(ii) | 1(iii) | 2(i) | 2(ii) | 2(iii)=2(i)+2(ii) | 3(i) | 3(ii) | 3(iii)=3(i)+3(ii) | 4(i) | 4(ii) | 4(iii)=4(i)+4(ii) | 5=1(iii)+2(iii)-3(iii) | |
| 315/25 | | | | 6,818,500,814 | 479,637,681 | 7,298,138,495 | 7,222,021,654 | 82,523,305 | 7,304,544,958 | 4,091,220 | - | 4,091,220 | 4,091,220 | 60,482,814 |

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

| | |
|---|---|
| (1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2025.12.31 දිනට මුදල් ශේෂය | 56,391,594 |
| (2) 2026/01/29 දිනට මෙම ශේෂයද පියවා ඇත. | 4,091,220 |
| 2026/01/29 දින වන විට පියවා ඇති මුළු ශේෂය | 60,482,814 |

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.
ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..........................................
ප්‍රධාන ගණකාධිකාරි
එච්.එම්. අනුෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

ඇමුණුම -4

## 2025 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 276

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

රු.

| තැන්පතු ගිණුමේ නම | තැන්පතු අංකය | 2025 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය තුළ බැර කිරීම් | වර්ෂය තුළ හර කිරීම් | 2025 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඇප තැන්පත් | 6000-0-0-1-0-58 | 157,800 | 358,868 | 75,300 | 441,368 | 441,368 |
| ටෙන්ඩර් තැන්පත් | 6000-0-0-2-0-76 | 2,017,960 | 11,340,000 | 9,057,460 | 4,300,500 | 4,300,500 |
| තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු | 6000-0-0-13-0-47 | 18,414,784 | 278,698,710 | 229,831,049 | 67,282,446 | 67,282,446 |
| කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල් | 6000-0-0-16-0-28 | 288,169,338 | 61,069,012 | 237,164,610 | 112,073,739 | 112,073,739 |
| වන්දි ගෙවීම් | 6000-0-0-17-0-7 | 203,128,209 | 35,504,787 | 66,392,586 | 172,240,409 | 172,240,409 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් | 6000-0-0-18-0-35 | 795,278 | 14,309,901 | 14,439,388 | 665,790 | 665,790 |
| එකතුව | | 512,683,368 | 401,281,277 | 556,960,394 | 357,004,251 | 357,004,251 |

H. Anusha
.................................
ප්‍රධාන ගණකාධිකාරී
එච්.එම්. අනුෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

18

## 2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 276

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

රු.

| | අත්තිකාරම් ගිණුමේ නම | අත්තිකාරම් ගිණුම් අංකය | 2025 ජනවාරි 01 දිනට ශේෂය (1) | වියදමෙහි උපරිම සීමා රු. 120,000,000 වර්ෂය තුළ හර කිරීම් (2) | | ලැබීම්වල අවම සීමා රු. 78,000,000 වර්ෂය තුළ බැර කිරීම් (3) | | හර ශේෂයන්ගේ උපරිම සීමා රු. 460,000,000 ශේෂය 4=(1)+(2)-(3) | බැරකම් පිළිබඳ උපරිම සීමා රු. …….. | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදලින් | හරස් සටහන් මගින් | මුදලින් | හරස් සටහන් මගින් | | | |
| (1) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 27601 | 257,462,107 | 120,113,281 | 14,444,054 | 87,186,203 | 23,323,524 | 281,509,714 | | 281,509,714 |
| (2) | අනෙකුත් අත්තිකාරම් | | | | | | | | | |
| (3) | විවිධ අත්තිකාරම් | | | | | | | | | |

** වියදමේ උපරිම හර සීමාව ඉක්මවීමට බලපා ඇත්තේ ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2025 සැප්තැම්බර් මස රු.191,816.00 හරස් සටහන් මගින් සිදුකරන ලද වැරදි හර කිරීමකි.

……………………………………
ප්‍රධාන ගණකාධිකාරී
එච්.එම්. අනූෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

## 2025 දෙසැම්බර් 31 දිනට කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

**වියදම් ශීර්ෂ අංකය : 276** **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : බදුල්ල**

| අත්තිකාරම් අංකය | ව්‍යාපෘති විස්තරය | ගෙවූ දිනය | වවුචර් අංකය | ගෙවූ මුදල (රු.) | 2025.01.01 දිනට ශේෂය (රු.) | 2025 වර්ෂය තුළ අයකිරීම් | | 2025.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | පෙර වර්ෂයට අදාළව | ප්‍රවර්තන වර්ෂයට අදාළව | |
| (1) කුලී අත්තිකාරම්<br>උදා.<br>9188-250-0-1-0-1<br>..................<br>.................. | | | | නැත | | | | |
| එකතුව (අ) | | | | | | | | |
| (2) වැඩ අත්තිකාරම්<br>උදා.<br>9188-250-0-2-0-1<br>..................<br>.................. | | | | | | | | |
| එකතුව (ආ) | | | | | | | | |
| මුළු එකතුව (අ)+(ආ) | | | | | | | | |

H. Anusha
..............................................................
ප්‍රධාන ගණකාධිකාරී
එච්.එම්. අනූෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

Generate

# Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2025

NEW CIGAS FINAL 2025 REPORTS

| | | | |
|---|---|---|---|
| **Land-9153:** | 1,122,543,000.00 | **Table:** | SA 82 |
| **Building- 9151:** | 1,316,321,488.35 | **Year:** | 2025 |
| **Machinary-9152:** | 453,100,335.51 | **Rpt Date** | 2/4/2026 9:45:17 AM |
| **WIP-9160:** | 235,863,617.35 | **Head** | 276 |
| **Intangible-9154:** | **0.00** | | |
| **Lease-9180:** | **0.00** | | |

| Ledger | category | Item | Code | Opn_Bal | Opn_Bal_Add | TransferIn | Purchase | Disposal | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9151 | 1.1-Dwellings | | 61111 | 288,649,344.24 | 0.00 | 0.00 | 8,046,918.23 | 12,541,727.44 | 284,154,535.03 |
| | | Garages | ****6111102 | 1,403,433.44 | 0.00 | 0.00 | 0.00 | 1,031,727.44 | 371,706.00 |
| | | Quarters | ****6111107 | 268,951,364.91 | 0.00 | 0.00 | 8,046,918.23 | 11,510,000.00 | 265,488,283.14 |
| | | Circuit Bunglows | ****6111108 | 18,294,545.89 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 18,294,545.89 |
| 9151 | 1.2-Non Residential Building | | 61112 | 973,047,541.69 | 102,392,500.00 | 0.00 | 0.00 | 43,375,273.37 | 1,032,064,768.3 |
| | | Office Building | ****6111201 | 973,047,541.69 | 102,392,500.00 | 0.00 | 0.00 | 43,375,273.37 | 1,032,064,768.3 |
| 9151 | 1.3-Other Structure | | 61113 | 102,185.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 102,185.00 |
| | | Pumping Station | ****6111311 | 102,185.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 102,185.00 |
| 9160 | 1.4-WIP-Building & Structure | | 61114 | 226,773,303.63 | 6,965,273.37 | 0.00 | 2,125,040.35 | 0.00 | 235,863,617.35 |
| | | Office Building | ****611148 | 226,773,303.63 | 6,965,273.37 | 0.00 | 2,125,040.35 | 0.00 | 235,863,617.35 |
| 9152 | 2.1-Transport Equipment | | 61121 | 167,465,900.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 167,465,900.00 |
| | | Passenger vehicle | ****6112101 | 165,043,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 165,043,000.00 |
| | | Cargo vechicle | ****6112102 | 500,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 500,000.00 |
| | | Agricultural vehicle | ****6112103 | 1,919,900.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 1,919,900.00 |
| | | Motor cycle | ****6112109 | 3,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 3,000.00 |
| 9152 | 2.2-Other Machinary & Equipment | | 61122 | 185,016,359.64 | 10,866,797.90 | 319,880.00 | 96,078,637.12 | 6,647,239.15 | 285,634,435.51 |
| | | Office Equipment | ****6112201 | 24,360,996.70 | 1,853,150.45 | 0.00 | 8,309,804.23 | 1,951,656.35 | 32,572,295.03 |
| | | Computer Equipment | ****6112202 | 75,431,367.05 | 7,075,578.80 | 200,500.00 | 32,851,168.26 | 2,394,640.00 | 113,163,974.11 |
| | | Electrical Equipment | ****6112203 | 10,494,061.16 | 124,900.00 | 97,680.00 | 5,529,505.40 | 132,408.00 | 16,113,738.56 |
| | | Communication Equipment | ****6112204 | 1,035,921.46 | 0.00 | 0.00 | 593,000.00 | 0.00 | 1,628,921.46 |
| | | Furniture | ****6112205 | 69,446,226.27 | 1,813,168.65 | 21,700.00 | 48,810,059.23 | 2,168,534.80 | 117,922,619.35 |
| | | Sports equipment | ****6112208 | 327,422.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 327,422.00 |
| | | Construction Eqipment | ****6112213 | 2,130,150.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 2,130,150.00 |
| | | Agricultural & Dairy Farm Equipment | ****6112216 | 1,724,200.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 1,724,200.00 |
| | | Fire Protection Equipment | ****6112217 | 66,015.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 66,015.00 |
| 9153 | 4.1-Land | | 61410 | 1,118,793,000.00 | 3,750,000.00 | 0.00 | 0.00 | 0.00 | 1,122,543,000.0 |
| | | Land | ****614100 | 1,118,793,000.00 | 3,750,000.00 | 0.00 | 0.00 | 0.00 | 1,122,543,000.0 |

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application--Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Development.

Print

New CIGAS. All Rights Reserved. Powered by Ministry of Finance Planing and Economic Development . -

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

ඒසීඒ-7

## අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම | 80,788 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් | 4,304,487,897 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් | 1,904,933 | |
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් | 21,774,456 | 4,328,248,074 |
| අඩු කළා : | | |
| අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් | 192,612,621 | |
| වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් | 37,550 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් | 17,861,620 | |
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් | 94,048.00 | |
| වෙනත් තැම්පත් ගිණුම් සඳහා එකතු කිරීම් | 3,472.00 | 210,609,311 |
| **2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය** | | **4,117,638,762** |

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

H Anusha
.......................................
ප්‍රධාන ගණකාධිකාරි
එච්.එම්. අනුෂා හේමමාලි මැණිකේ
දිනය : 2026/02/23

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

සටහන -(i)

# පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය (2025)

**(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)**

වියදම් ශීර්ෂ අංකය 276 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: බදුල්ල

වැඩසටහන් අංකය හා නාමය :01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/කපාහැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු 25,000.00 | අඩු | 0 | |
| රු 25,000.00 | වැඩි | 1 | 48,763 |
| එකතුව | | 1 | 48,763 |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| වාහන අනතුරු අලාභ අයකර ගැනීම් | 0 | 0.00 |
| එකතුව | 0 | 0.00 |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු 25,000.00 | අඩු | 0 | - |
| රු 25,000.00 | වැඩි | 0 | - |
| එකතුව | | 0 | - |

**(ii) අනුව කාල විශ්ලේෂණය**

| | | | |
|---|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | | 0 |
| | ගණන | රු. | - |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | | 0 |
| | ගණන | රු. | - |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | | 1 |
| | ගණන | රු. | 48,763 |

| | අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|---|
| 1 | S.D ගුණදාස මයාගේ අභාවය හේතුවෙන් ඔහුගේ ණය ශේෂ කපාහැරීම | | 48,763 |
| | එකතුව | | **48,763** |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම්

.....................................

එච්.එම්.අනූෂා හේමමාලි මැණිකේ
ප්‍රධාන ගණකාධිකාරි
දිනය : 2026/02/12

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

Generate --

# Cumulative Commitment/ Liability Report for the Year - 2025

| | | | |
|---|---|---|---|
| To | | **Printed by** | **combined276** |
| **District Secretariat - Badulla (276)** | | **New Table No** | **:SA-92** |
| From | | **Old Table No** | **:--** |
| **Director General, ,** **Department of State Accounts, ,** | | **Report Date** | **2/19/2026 1:21:34 PM** |
| **General Treasury, Colombo1. ,** | | | |

NEW CIGAS FINAL 2025 REPORTS

This is a computer-generated document. No signature is required.

Report Generated by the new CIGAS Web Application--Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Development..

-

Print

New CIGAS. All Rights Reserved. Powered by Ministry of Finance Planing and Economic Development . -

^

H.M. ANUSHA HEMAMALI MANIKE
Chief Accountant
District Secretariat - Badulla.

ඇමුණුම - (viii)

**2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව**

වියදම් ශීර්ෂ අංකය: 276

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: බදුල්ල

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2025.12.31 දිනට මුදල් පොත අනුව (රු.) | 2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 1 | මහජන බැංකුව- යූනියන් පෙදෙස | 9027032 | | | | 2025 දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව- බදුල්ල | 7042240 | 147,116,239 | | 1,200 | 2025 දෙසැම්බර් |
| 3 | මහජන බැංකුව- මහියංගණය | 9027051 | 93,625,728 | | | 2025 දෙසැම්බර් |
| 4 | මහජන බැංකුව- මහියංගණය | 9027068 | 41,898,366 | | | 2025 දෙසැම්බර් |
| 5 | ලංකා බැංකුව- මීගහකිවුල | 7042261 | 34,294,239 | | 400 | 2025 දෙසැම්බර් |
| 6 | මහජන බැංකුව- කන්දකැටිය | 9027056 | 28,672,097 | | | 2025 දෙසැම්බර් |
| 7 | මහජන බැංකුව- මුතියංගන ශාඛාව | 9027071 | 25,052,871 | | | 2025 දෙසැම්බර් |
| 8 | මහජන බැංකුව- මුතියංගන ශාඛාව | 9027065 | 51,073,470 | | | 2025 දෙසැම්බර් |
| 9 | ලංකා බැංකුව- පස්සර | 7042252 | 37,340,537 | | | 2025 දෙසැම්බර් |
| 10 | මහජන බැංකුව- හාලිඇල | 9027047 | 55,149,122 | | | 2025 දෙසැම්බර් |
| 11 | ලංකා බැංකුව- වැලිමඩ | 7042255 | 66,754,053 | | | 2025 දෙසැම්බර් |
| 12 | ලංකා බැංකුව- ලුණුගල | 7042246 | 51,219,214 | | 4,750 | 2025 දෙසැම්බර් |
| 13 | මහජන බැංකුව- බණ්ඩාරවෙල | 9027038 | 20,261,800 | | | 2025 දෙසැම්බර් |
| 14 | ලංකා බැංකුව- ඇල්ල | 7042258 | 47,340,286 | | | 2025 දෙසැම්බර් |
| 15 | මහජන බැංකුව- දියතලාව | 9027041 | 41,520,112 | | | 2025 දෙසැම්බර් |
| 16 | මහජන බැංකුව- හල්දුම්මුල්ල | 9027044 | 37,282,258 | | | 2025 දෙසැම්බර් |
| 17 | ලංකා බැංකුව- ලුණුගල | 7042249 | 21,628,213 | | | 2025 දෙසැම්බර් |
| | එකතුව | | 800,228,603 | - | 6,350 | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.................................

ප්‍රධාන ගණකාධිකාරී

එච්.එම්. අනුෂා හේමමාලි මැණිකේ

දිනය : 2026/02/22

H.M. ANUSHA HEMAMALI MANIKE

Chief Accountant

District Secretariat - Badulla.

29

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන් තුවේ ප්‍රතිශතයක් ලෙස |
| **10.02 දේශිය භාණ්ඩ හා සේවා බදු** | | | | | |
| 10.02.07.00 | මුද්දර ගාස්තු | | | 153,980.00 | |
| **10.03 බලපත්‍ර ගාස්තු හා වෙනත්** | | | | | |
| 10.03.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන් තුවට අදාළ ලියාපදිංචි කිරිමේ ගාස්තු | | | - | |
| 10.03.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහන | | | 1,133,548.21 | |
| 10.03.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය අදාළ බලපත්‍ර ගාස්තු | | | 615,550.00 | |
| 10.03.07.09 | කාබන් බද්ද | | | 653.07 | |
| 10.03.07.99 | අනෙකුත් | | | 11,798,519.41 | |
| **20.02 රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම්** | | | | | |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | | | 901,362.73 | |
| 20.02.01.02 | රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් | | | 65582.93 | |
| 20.02.02.99 | අනෙකුත් | | | 11,399,453.57 | |
| **20.03 විකුණුම් හා ගාස්තු** | | | | | |
| 20.03.02.03 | 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරිමේ පනත යටතේ ගාස්තු | | | 16,451,700.00 | |
| 20.03.02.12 | රාජ්‍ය කොන්ත්‍රාත් පණත යටතේ අයකරන ගාස්තු | | | - | |
| 20.03.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | | | 13,450.00 | |

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන් තුවේ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | **ප්‍රතිශතයක් ලෙස** |
| 20.03.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනිකුත් ලැබීම් | | | 3,091,650.00 | |
| 20.03.02.99 | විවිධ | | | 26,091,355.98 | |
| 20.03.99.00 | අනිකුත් ලැබීම් | | | 1,047,773.74 | |
| **20.04 සමාජ රක්ෂණ දායක මුදල්** | | | | | |
| 20.04.01.00 | මධ්‍යම රජය | | | 111,324,255.19 | |
| **20.06 ප්‍රාග්ධන ආදායම්** | | | | | |
| 20.06.02.01 | වාහන | | | - | |
| 20.06.02.02 | අනෙකුත් | | | 328,740.00 | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්ථන | 2,016,181,000.00 | 2,139,924,900.00 | 2,065,534,778.74 | 103.60 |
| ප්‍රාග්ධන | 384,000,000.00 | 386,125,100.00 | 371,718,960.34 | 103.88 |
| **එකතුව** | **2,400,181,000.00** | **2,526,050,000.00** | **2,437,253,739.08** | **96.48** |



## 3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අමාත්‍යාංශය | වැය ශීර්ෂය | 2025 ප්‍රතිපාදන මුදල (රු.) | 2025 වියදම (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ජනාධිපති කාර්යාලය | 001 | 55,551,395.92 | 19,336,387.30 | 34 |
| මුදල්, ක්‍රමසම්පාදන, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 102 | 1,703,162,093.00 | 1,681,561,054.87 | 98.73 |
| ආරක්ෂක අමාත්‍යාංශය | 103 | 1,215,338,954.98 | 917,746,835.59 | 75.51 |
| අධිකරණ බන්ධනාගාර කටයුතු හා අණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 110 | 41,089,635.40 | 36,949,417.78 | 89.92 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 111 | 17,384,502.26 | 16,404,055.89 | 94.36 |
| විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 112 | 163,400.00 | 133,660.00 | 81.79 |
| ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 117 | 239,268,605.15 | 34,710,165.15 | 14.51 |
| කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | 118 | 131,619,316.23 | 87,725,501.06 | 66.65 |
| නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය | 123 | 19,899,862.00 | 14,781,414.62 | 74.27 |
| ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය | 124 | 39,329,744.89 | 38,675,457.89 | 98.34 |
| රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130 | 67,671,209.86 | 51,850,127.58 | 76.62 |
| වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 135 | 266,000,000.00 | 203,142,307.00 | 76.36 |
| කර්මාන්ත අමාත්‍යාංශය | 149 | 35,058,739.07 | 33,718,085.29 | 96.17 |
| පරිසර අමාත්‍යාංශය | 160 | 8,584,026.00 | 11,980,098.44 | 139.56 |
| කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 171 | 671,227,806.78 | 592,993,221.44 | 88.34 |
| විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 196 | 4,322,274.82 | 3,658,217.73 | 84.63 |
| රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 210 | 329,440.75 | 284,631.33 | 86.40 |

| අමාත්‍යාංශය | වැය ශීර්ෂය | 2024 ප්‍රතිපාදන මුදල (රු.) | 2024 වියදම( රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 220 | 5,280,000.00 | 1,890,042.64 | 35.80 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 254 | 7,425,270.66 | 6,889,695.80 | 92.78 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 253 | 76,660,420.00 | 76,537,125.70 | 99.84 |
| පේෂකර්ම දෙපාර්තමේන්තුව | 303 | 25,449,411.19 | 21,901,600.00 | 86.06 |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 307 | 5,193,521.45 | 4,828,014.16 | 92.96 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහ | 1,316,321,488.35 | 1,316,321,488.35 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 456,888,419.57 | 456,888,419.57 | - | 100% |
| 9153 | ඉඩම් | 1,122,543,000.00 | 1,122,543,000.00 | - | 100% |
| 9160 | කෙරී ගෙන යන වැඩ | 285,863,617.35 | 285,863,617.35 | - | 100% |
| **එකතුව** | | 2,895,752,908.00 | 2,895,752,908.00 | - | 100% |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

9 01

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UPCG/BD/A/DS/FS/2025

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 20 දින.

26 MAY 2026

26 MAY 2026

ගණන්දීමේ නිලධාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

යථෝක්ත වාර්තාව සහ පරීක්ෂා කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.ජී. මදරසිංහ

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත:- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ-1

2/2

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | UPCG/BD/A/DS/FS/2025 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026 මැයි 2 වදින |

ගණන්දීමේ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබදව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 276 -බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණතත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය

ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර 2019-2023 කාලපරිච්ඡේදය තුළ වැඩ අවසන් කරන ලද රු.218,731,333ක් වූ ව්‍යාපෘති 03ක වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමෙහි දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් අපහරණය කිරීම මඟින් උපයාගෙන තිබූ රු.227,200 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දී තිබූ ණය මුදල් වලින් රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, පළාත් සභාවල ආයතන

වලට මාරු වී ගිය නිලධාරීන්, මියගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනමට ලක් වූ නිලධාරීන්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්, විවිධ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වලට නිරවුල් කල යුතු ශේෂ සහ නිශ්චිතව හඳුනාගත යුතු වෙනත් නිලධාරීන් ලෙස එකතුව නිලධාරීන් 30 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණයවල වටිනාකම රු.2,466,994 ක් වූ අතර එම ණය ශේෂ වල වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින සේවක ණයවල වටිනාකම රු.466,496 ක් විය.

(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව වැය ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම නිසි අයවැය පුරෝකථනයකින් තොරව සිදු කිරීම හේතුවෙන් වැය විෂය අංක 1205 - වෙනත් සැපයීම් හා 1303 - ගොඩනැගිලි සහ ඉදි කිරීම් නඩත්තු වියදම් යන වැය විෂයයන් වෙනුවෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන ඉතිරිව තිබියදී මුදල් රෙගුලාසි 66/69 මඟින් තවදුරටත් ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර 2025 දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදන සියයට14 සිට සියයට 33 දක්වා ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව පුනරාවර්තන වැය විෂයයන් 18ක සහ මූලධන වැය විෂයයන් 08ක මුළු වියදමින් පිළිවෙලින් සියයට 30ත් සියයට 100ත් දක්වා සහ සියයට 31 ත් සියයට 81ත් දක්වා ප්‍රමාණයක් දෙසැම්බර් මාසය තුළ වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) වැය විෂයයන් 12කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා සලසා දී තිබූ රු.108,050,000 ක ප්‍රතිපාදන වලින් රු.30,578,472 ක් ඉතිරිව තිබූ අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් ලද ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 11 සිට සියයට 67 දක්වා පරාසයක විහිදී තිබුණි.

### 3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2026 ජනවාරි මාසය තුළදී ගෙවීම් කරන ලද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපිය වූ බිල්පත් වටිනාකම රු. 833,996 ක් වූ අතර එම බිල්පත් සම්බන්ධයෙන් 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

සමාලෝචිත වර්ෂයට අදාළව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් රු.මිලියන 3,912 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එයින් රු.මිලියන 3,247 ක් වැයකර තිබුණු අතර ප්‍රතිපාදනයෙන් සියයට 4 සිට සියයට 85 දක්වා ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

### 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ .

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| 1907 අංක16 දරන වන සංරක්ෂණ ආඥා පනතේ 64(2)(ඊ) වගන්තිය (451 වන අධිකාරිය) ප්‍රකාරව විෂයය භාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් සාදන ලද 2009 මැයි 06 දිනැති අංක 1600/18 හා 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් එල කරන ලනියෝග | රජයේ ඉඩම් වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීමේදී රජයට අයකරගත යුතු කඩා ඉවත් කරන ලද කළුගල් කියුබ් 681,345 ක් වෙනුවෙන් 2014 සිට 2024 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.485,634,424 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

XIX පරිච්ඡේදයේ 5.8 වන වගන්තිය

රජයේ නිවාස වලට අදාළව ජලය, විදුලිබලය සහ ගෑස් සඳහා ගාස්තු පදිංචි නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද 2003-2008 කාල පරිච්ඡේදය තුල කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කාර්ය මණ්ඩල නිල නිවාසයෙහි පදිංචි වී සිටි නිලධාරීන් විසින් ගෙවිය යුතු තිබූ රු.203,259 ක හිඟ ජල ගාස්තු 2025 නොවැම්බර් 12 දින වන විටත් අදාල නිලධාරීන් විසින් නිරවුල් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

මුදල් රෙගුලාසි 104

(i) අලාභ හානිය සිදු වූ හෝ ඒ බව දැනගැනීමට ලැබීමෙන් පසු පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරයි නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවද, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය මඟින් 2023 ජනවාරි 18 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ පරිගණක උපාංගවලට (ප්‍රොජෙක්ටරයට) හානි සිදුවීම සම්බන්ධයෙන් හානිය සිදුවී වසර 03 මාස 02ක් ගත වී තිබුණද ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අලාභයක් සිදුවූ හෝ ඒ බව දැනගැනීමට ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.8,147,084 ක අලාභ හානි 3ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(iii) 2009 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අනතුර සිදුවී දීර්ඝ කාලයක් ගත වූ රු.5,763,832 ක අලාභ හානි 5ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ඈ) කාර්යපටිපාටික රීති සංග්‍රහය
රීති 139

යොමුගත රීති ප්‍රකාරව ආවරණ අනුමැතියද නොමැතිව, ඌවපරණගම ප්‍රාදේශීය ලේකම්

| | | |
|---|---|---|
| | | කාර්යාලයේ වැඩබලන ගණකාධිකාරි වෙත, 2020 ඔක්තෝබර් 09 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා වැඩ බැලීමේ වැටුප්, ප්‍රවාහන දීමනා, සංයුක්ත දීමනා සහ නිවාඩු දින වැටුප් රු.1,010,032 ක ගෙවා තිබුණි. |
| (ඉ) | 2023 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය | යොමු ගත ස්ථානමාරු ප්‍රතිපත්තියේ 2.2.2. සහ 2.2.3 ඡේද ප්‍රකාරව එක් සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් විය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක නිලධාරීන් 92ක් වසර 05 සිට වසර 30ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරමින් පැවතුණි. |

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද හරිතාගාර ව්‍යාපෘතියට අදාල ව ඉදිකල යුතු හරිතාගාරයක ප්‍රමාණය වර්ග අඩි 1000ක් විය යුතු වුවද බොකන්ඔරුව වසමේ ප්‍රතිලාභීන් 22 දෙනෙකු විසින් ගිවිසුම් ප්‍රකාරව ඉදිකල යුතු වර්ග අඩි ප්‍රමාණයට වඩා අඩු වර්ග ප්‍රමාණයන්ගෙන් යුතු හරිතාගාර ඉදිකර තිබුණි.

(ආ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ හරිතාගාර තුල වගා කරන ලද එළවළු රැස්කිරීම හා විජලනය කර කෘෂි නිෂ්පාදන සකස් කිරීමේ අරමුණින් 2021 වර්ෂයේදී රු.1,950,000ක් වැය කර බොකන්ඔරුව වසමේ ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම සහ බිත්ති ඉරි තැලීම්, ජනෙල් වලට කෘමීන් හානි කිරීම් හා වහලයේ යකඩ ආධාරක වල මළබැඳීම් පැවතුණි

(ඇ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේ දී රු. 4,890,000 ක් වැය කර තොටලාගල වසමේ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණු අතර ඒ යටතේ එළු පැටවුන් 69 දෙනකු හා කුකුල් පැටවු 1000ක් පිළිවෙලින් ප්‍රතිලාභීන් 23 දෙනෙකු හා 52 දෙනෙකු වෙත ලබාදී තිබුණි. මෙ සම්බන්ධයෙන් 2025 ඔක්තෝබර් 17 දින සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 09 දෙනෙකු වෙත ලබා දී තිබූ එළුවන් 27ක් අතරින් 17 දෙනෙකු සහ ප්‍රතිලාභීන් 11 දෙනෙකු වෙත ලබා දී තිබූ කුකුල් පැටවුන් 240 ක් අතරින් 114 දෙනෙකු මිය ගොස් තිබුණු අතර කුකුල් පැටවුන් ලබා දී තිබුණු ප්‍රතිලාභීන් 04 දෙනෙකුට අදාළව ගැහැණු හා පිරිමි සතුන් නියමිත අනුපාතයට ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන 2021යටතේ රු.3,538,040 ක් වැයකර මහතැන්න හා අළුගොල්ල වසම්වල තෝරාගත් ප්‍රතිලාභීන් 34 දෙනෙකු වෙත එක් ප්‍රතිලාභියෙකුට කිකිළි පැටවුන් 125 බැගින් 4250ක් ලබා දී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 05කට ආසන්න කාලයක් ගත වී තිබුණද ප්‍රතිලාභීන් 34 දෙනාගෙන් 25 දෙනෙකුගේ ආදායම් මට්ටම අපේක්ෂිත මට්ටමට වර්ධනය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය - 2021 යටතේ රු.10,227,818 ක් වැයකර දකුණු කැබිල්ලවෙල හා ලියන්ගහවෙල වත්ත යන ග්‍රාම නිලධාරි කොට්ඨාශ ආවරණය වන පරිදි ප්‍රතිලාභී පවුල් 183 ක් තෝරාගෙන වසර 5ක කාලයක් සඳහා හරිතාගාර තුළ මල් හා එළවළු වගාකිරීම, කුකුල් පාලනය, එළුවන් පාලනය හා මී මැසි පාලනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2026 ජනවාරි 09දින සිදුකල පරීක්ෂාවේ දී රු.1,320,000 ක් වැයකර ලබා දී තිබුණු කිකිළි පැටවුන් 3,000ක් අතරින් කිකිළි පැටවුන් 2925ක් සහ රු.2,272,500 ක් වැයකර ලබාදී තිබුණු එළුවන් 80 දෙනෙකු අතරින් එළුවන් 50 දෙනෙකු මියගොස් සිටි අතර රු.1,656,183 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු මී මැසි පාලන ව්‍යාපෘතියේ පසුගිය වසර 4ක මුලු අලෙවි ආදායම ව්‍යාපෘතිය සඳහා වැයකළ මුදලින් සියයට 28.8 ක් තරම් අඩු අගයක් වූයෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ආදායම් ඉලක්ක ළගාකර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය -2021 යටතේ ඉලුක්තැන්න ග්‍රාම නිලධාරි වසමේ කිර වගා ව්‍යාපෘතියක් හා කුකුල් පාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 09 දින සිදුකල පරීක්ෂාවේදී කිර වගාව සඳහා පාත්ති සකස් කිරීමට වැය කර තිබුණු රු. 3,099,765ක වියදම විකල්ප අධ්‍යයනයකින් තොරව දැරූ වියදමක් බව නිරීක්ෂණය වූ අතර ප්‍රතිලාභීන් 50 දෙනෙකු වෙත රු.2,351,900ක් වැය කර ක්‍රියාත්මක කර තිබුණු කුකුල් පාලන ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් 11 දෙනෙකු ඉවත් වී තිබීම හේතුවෙන් කුකුල් කූඩු ඉදිකිරීම හා කුකුල් පැටව් ලබා දීම වෙනුවෙන් වැයකර තිබුණු රු. 517,418ක මුදල නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. එමෙන්ම ප්‍රතිලාභීන් දෙදෙනෙකු සතුව පැවති බිත්තර රක්කවන උපකරණ 02ක් හා විදුලි ජනන යන්ත්‍ර 02ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(උ) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේදී රු. 952,380 ක මුදලක් වැය කර රණසිංහගම ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කර තිබුණු අතර එහි ඉදිරිපස දොර හා අලුතින් ඉදි කරන ලද බිත්තිය ඉරි තලා තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඌ) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කඳුකර දශකය සංවර්ධන වැඩසටහන 2024 යටතේ වැඩ අවසන් කර තිබුණු භෞතිකව පරීක්ෂා කරන ලද මාර්ග 06 ක ප්‍රසාරණ මූට්ටු යොදා නොතිබූ අතර ඒ සඳහා රු. 71,922ක් ගෙවීම් කර තිබුණි.

### 4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.10,734,729 ක් වැයකර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 04 කට ආසන්න

කාලයක් ගතවී තිබුණද, විගණිත දිනය වූ 2025 අගෝස්තු 05වන විටත් ව්‍යාපෘතිය ආරම්භක අවධියේ පසුවන බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති වාර්තාව අනුව සංචාරකයින් ඉලක්ක කරගත් නිෂ්පාදන බිහිකිරීම, අපනයන වෙළඳපල ඉලක්ක කරගත් නිෂ්පාදන ඇති කිරීම ඇතුළු අනෙකුත් අරමුණු සඵලදායී ලෙස ඉටුකරගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරි සැලැස්මක්ද 2025 වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. අමුද්‍රව්‍ය සපයා ගැනීම, නිෂ්පාදනවල ගුණාත්මක භාවය, පුහුණු අවශ්‍යතාවය හා  වෙළඳපල හඳුනාගැනීම සම්බන්ධයෙන් වූ ගැටළු හේතුවෙන් ප්‍රතිලාභීන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදන කටයුතු නවතා දමා ප්‍රතිලාභීන් ඉතා සුළු ප්‍රමාණයක් ඇණවුම් මත පමණක් නිෂ්පාදන කටයුතු සිදුකරමින් පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් රු.මි.10 කට ආසන්න මුදලක් වැයකර ඇති මෙම ව්‍යාපෘතියෙන් අයෝජනයට සාපේක්ෂව ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.

### 4.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩුවත්ත ග්‍රාම නිලධාරි වසමේ 2015 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසයන් තුල සිදු වූ නායයෑමෙන් සෘජුවම බලපෑමට ලක්වූ පවුල් 124ක් සම්බන්ධයෙන් දැඩි අවදානම් තත්ත්වය මත, අස්ථාවරයට පත්ව ඇති පාෂාන කුට්ටි පාලිත තත්ත්ව යටතේ පුපුරුවා ඉවත් කිරීම හෝ වෙනත් සුදුසු ස්ථානයක පදිංචි කරවන ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂන සංවිධානය විසින් 2016 ජනවාරි මස නිකුත් කරන ලද භූ සමීක්ෂණ වාර්තාව මඟින් නිර්දේශ කර තිබුණි. වාර්තාව නිකුත් කර වර්ෂ 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණද අධි අවදානම් සහිත ප්‍රදේශවල සිටින  පවුල් නැවත පදිංචි කිරීම සඳහා සාධනීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩොල්සිම සහ උඩපංගුව ග්‍රාම නිලධාරි වසම් වල ආපදාවන්ට ලක්වූ පවුල් 52 ක් 2016 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ඉන් මඩොල්සිම ග්‍රාම නිලධාරි වසමේ ආපදාවට පත්වූ පවුල් 50ක් නැවත පදිංචි කිරීම සඳහා වැරැල්ල පතන වතු යායේ , ක්ෂේත්‍ර අංක 3A  දරන ඉඩමට අදාළව භූ සමීක්ෂන වාර්තාව 2024 පෙබරවාරි 15 දින ලබාගෙන තිබුණ ද නැවත පදිංචි කිරීමට අදාළව වෙනත් සාධනීය ක්‍රියාමාර්ග  ගෙන නොතිබුණි.

(ඇ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  දඹේතැන්න ග්‍රාම නිලධාරී වසමේ නායයෑමේ අධි අවධානමට ලක් වූ පවුල් 65ක් 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු අතර එම පවුල් නැවත පදිංචි කරවීම සඳහා දඹේතැන්න වත්තේ මා උස්ගොල්ල කොටසේ ක්ෂේත්‍ර අංක 30,21 B  හා 20 දරන ඉඩම් කොටසට අදාළව 2019 මාර්තු 07 දින භූ සමීක්ෂණ වාර්තාව ලබාදී තිබුණි. 2023 දෙසැම්බර් 06 දින වන විට එක් ප්‍රතිලාභියෙකුට රු.1,200,000ක්  බැගින්  ප්‍රතිලාභීන් 31 දෙනෙකු වෙත රු. 37,200,000ක් ගෙවීම් කර තිබුණු අතර විගණිත දිනය වූ 2025  ඔක්තෝබර් 17 වන විට ව්‍යාපෘති ආරම්භ කර වර්ෂ 06කට ආසන්න කාලයක් ගත වී තිබුණද නිවාස ව්‍යාපෘතියේ  කටයුතු අවසන් කර අවදානමට ලක් වූ පවුල්  නැවත පදිංචි කර නොතිබුණි.

(ඈ) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹේවෙල ග්‍රාම නිලධාරි වසමට අයත් වෝවික්වත්ත ප්‍රදේශයේ සහ මාලිගාතැන්න ග්‍රාම නිලධාරි වසමට අයත් වතු නිවාස සහ වෝවික්වත්ත ක්ෂේත්‍ර අංක 18 ප්‍රදේශයේ පිළිවෙලින් 2014 දෙසැම්බර් හා 2017 නොවැම්බර් මස සිදු ව තිබූ නායයෑම්

වලින් බලපෑමට ලක්වූ පවුල් ආරක්ෂිත ස්ථානයක පදිංචි කරවන ලෙස හූ සමීක්ෂණ වාර්තා මගින් නිර්දේශ ලබාදී වසර 10ක පමණ කාලයක් ගත වී තිබුණද, අධි අවදානම් සහිත ප්‍රදේශ වල පවුල් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඉ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 18 ක් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2014,2015 හා 2017 වර්ෂයේදී නිකුත් කරන ලද භූ සමීක්ෂණ වාර්තා මගින් අධි අවදානම් සහිත ප්‍රදේශ වල සිටින පවුල් 264ක් වෙනත් සුදුසු ස්ථානයක පදිංචි කරවන ලෙස නිර්දේශ කර තිබුණු අතර එම නිර්දේශ නිකුත් කර වර්ෂ 10කට ආසන්න කාලයක් ගත වී තිබුණද අධි අවදානම් සහිත ප්‍රදේශ වල පවුල් නැවත පදිංචි කිරීම සඳහා සාධනීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඵලදායි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.1,379,981 ක් වැයකර මිලදී ගෙන තිබුණු රෙදි පින්තාරු කිරීමේ උපකරණ ඒකක57 ක් හා ග්‍රාම නිලධාරී වසම් 03 ක කුඩා කණ්ඩායම් 03 ක් වෙත ලබා දී තිබුණු උපකරණ ඒකක 22 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද රෙදි පින්තාරු කිරීමේ ව්‍යාපෘතියට අදාළව 2021 දෙසැම්බර් 31 දින පෞද්ගලික වෙළඳ ආයතනයක් වෙතින් එකක් රු.166,250 ක් වූ ZOJE Interlock Machine 03ක් ඇණවුම් කර ඊට අදාළව Interlock Machine 01 ක් සහ MCZJ757C වර්ගයේ ඕවර්ලොක් මැෂින් 02ක් මිලදී ගෙන තිබුණි. ලබාදුන් භාණ්ඩ ඇණවුම සමඟ භාණ්ඩ ලැබීමේ පත්‍රය හා ලද භාණ්ඩ විධිමත් පරීක්ෂාවකින් තොරව භාරගැනීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නොවන ඕවර්ලොක් මැෂින් 02 ක් සඳහා රු.309,400 ක් වැයකර තිබුණු අතර 2025 අගෝස්තු 05 දින වන විටත් එම මැෂින් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු සුදු ගම්මිරිස් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව රු. 940,000 ක් වැය කර ස්ථාපිත කර ඇති ගම්මිරිස් වියලන යන්ත්‍රය හා Pepper thresher Machine ඇතුළු යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඒකක 09ක් 2025 අගෝස්තු 27 දින වන විටද නිශ්කාර්යව පැවතුණි.

(ඈ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී රු.7,181,825 ක් වැයකර හරිතාගාර තුල එළවළු වගා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණු අතර බොකන්ඔරුව වසමේ ඉදිකර තිබුණු හරිතාගාර 09 ක් ව්‍යාපෘතිය ආරම්භ කර වසර 04ක් ගතවුවද කිසිදු නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි.

(ඉ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ හරිතාගාර තුල වගාකරන ලද එළවළු රැස් කිරීම , විජලනය කිරීම හා කෘෂි නිෂ්පාදන

සකස්කර වෙළඳපොල වෙත නිකුත් කිරීම මූලික අරමුණ කර ගනිමින් 2021 වර්ෂයේදී රු.1,950,000ක් වැයකර බොකන්ඕරුව වසමේ ඉදිකර තිබුණු බහුකාර්ය ගොඩනැගිල්ල 2025 සැප්තැම්බර් 04 දින වන විටත් අදාල කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි.

(ඊ) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු. 2,275,000ක් වැයකර මිලදීගෙන තිබුණු ගම්මිරිස් වියලන යන්ත්‍රය 2024 මැයි 13 දින හදිසි පිපිරීමකට ලක්ව තිබුණු අතර 2025 සැප්තැම්බර් 19 වන විටත් එම යන්ත්‍රය අලුත් වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු පහළ කඳුරුගමුව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු. 521,750ක් වැයකර මිලදී ගෙනතිබුණු උපකරණ හා යන්ත්‍ර ඒකක 07ක් 2025 ඔක්තෝබර් 17 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ඌ) 2021 වර්ෂයේදී ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන සඳහා රු. 119,750 ක් වැයකර මිලදී ගෙන තිබුණු ජල පොම්ප 05 ක් එම වැඩසටහන සඳහා භාවිතයට නොගැනීම හේතුවෙන් හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්වභාවික මල් නිෂ්පාදකයන්ගේ ගම්මානය සඳහා 2025 ජනවාරි 28 දින ලබා දී තිබුණද 2025 ඔක්තෝබර් 16 දින වන විටත් භාවිතයට නොගෙන ඇසුරුම් තුළම පැවතුණි.

(එ) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී රු. 1,960,000 ක් වැය කර සැකසුම් මධ්‍යස්ථානයක් ඉදි කර තිබූ අතර විගණිත දිනය වූ 2025 පෙබරවාරි 09 දින වන විටත් මෙම මධ්‍යස්ථානය අදාළ කාර්යය සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. මධ්‍යස්ථානයේ නිෂ්පාදන සැකසුම් කාර්යය සඳහා රු. 957,000ක් වැය කර මිලදී ගෙන තිබූ එළවළු ශීත කිරීමේ යන්ත්‍රයක්, රු. 500,000ක් වැය කර මිල දී ගෙන තිබූ විජලන යන්ත්‍ර 5ක් හා පොලිතින් සීලර් යන්ත්‍ර 02ක් ව්‍යාපෘතිය ආරම්භ කර වසර 04ක් ඉක්මවන තෙක් භාවිතයට නොගෙන සැකසුම් මධ්‍යස්ථානය තුළ නිෂ්කාර්යව ගබඩා කර පැවතුණි.

(ඒ) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන යටතේ තෙල්බැද්ද පහල කොටස ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා රු. 344,500ක් වැය කර ලබා දී තිබූ විදුලි ජනන යන්ත්‍රය හා බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රය සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 09 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී විදුලි ජනන යන්ත්‍රය නිවසකද බ්ලොක්ගල් නිෂ්පාදන යන්ත්‍රය වෙවැස්ස වසමේ පුද්ගලයකු සතුව නිෂ්කාර්යවද පැවති බව නිරීක්ෂණය විය.

### 4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයේ 1 වන වගන්තිය ප්‍රකාරව, සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව හා ඵලදායිව සිදු කිරීම අරමුණු කරගනිමින් ප්‍රසම්පාදන අස්තිත්වය විසින් හදිසි ප්‍රසම්පාදනයක් පිළිබඳව හැර, සිය එක් එක් ප්‍රසම්පාදනයන් පූර්වයෙන් සැලසුම් කිරීමට අදාළව ප්‍රධාන ප්‍රසම්පාදනයන් සැලැස්ම, වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන

සැලැස්ම, සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාල සටහන සකස් කල යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් විසින් අදාළ ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නොතිබුණි.

(ආ) බණ්ඩාරවෙල බටහිර ග්‍රාම නිලධාරි වසමෙහි, බණ්ඩාරවෙල ප්‍රධාන තැපැල් කාර්යාලය ඉදිරිපස ඉන්ටර්ලොක් කිරීම, ඇතුළත ගේට්ටුව අලුත්වැඩියා කිරීම හා සංවර්ධන කටයුතු කිරීම සඳහා රු.1,690,681 ක ගිවිසුම්ගත වටිනාකමකට මාසයක් තුළ කර්මාන්තය අවසන් කිරීම සඳහා බණ්ඩාරවෙල ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලය සමඟ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් විසින් 2025 නොවැම්බර් 04 වන දින ගිවිසුම් ගත වී තිබුණි. කර්මාන්තය පවතින මිල ගණන් යටතේ ඉටු කිරීම අපහසු බව 2025 නොවැම්බර් 18 දිනැති ලිපියෙන් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා තිබුණද ව්‍යාපෘතිය ඉටු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 10 වැනි පරිච්ඡේදයේ 1 වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03ක් සතු නිල නිවාස 19ක් දිර්ඝ කාලයක සිට පදිංචියට නුසුදුසු තත්වයක පවතින බව නිරීක්ෂණය වූ අතර එම නිල නිවාස අලුත්වැඩියා කර රජය සතු දේපල ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සාධනීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අයත් නිල නිවාස රජයේ ඉඩම් වල පිහිටා තිබුණු අතර එම ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.

**4.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 මාර්තු මස මිය ගොස් තිබුණු ප්‍රතිලාභියෙකු වෙත රු. 431,004 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු අතර 2025 ඔක්තෝබර් 17 වන විට එම මුදලින් රු.246,004 ක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි.

(ආ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිපුර ගෙවන ලද රු.386,075ක විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව උරුමකරුවන්ගෙන් අයකර ගතයුතු රු.386,075 ක මුළු මුදල ගෙවීමට නොහැකි බව උරුමකරුවන් විසින් 2024 මාර්තු 05 වන දින දැනුම් දී වසර 2ක් ගත වී තිබුණද, රජයට සිදු වූ අලාභය අයකර ගෙන නොතිබුණි.

(ඇ) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2017 ජූලි 29 දින අනතුරට පත්වී තිබුණු අතර ඊට අදාළව සිදුවී තිබුණු රු. 6,349,333 ක මුළු අලාභයෙන් රු.2,500,000ක් රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය කර තිබුණි. 2026 මාර්තු 27වන විටද රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය නොකල රු. 3,849,333 ක අලාභය වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ අටකට පසු ඊට අදාළ හානිය රු.500,000ක් ලෙස 2019 මැයි 15 දින තක්සේරුකර තිබුණු අතර මුදල් රෙගුලාසි 104(4) පූර්ණ වාර්තාවට අනුව අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණද 2026 මාර්තු 27 දින වන විටද අලාභය අයකර ගෙන නොතිබුණි.

(ඉ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ් රථයක් 2022 පෙබරවාරි 14 දින මීගහකිවුල බලගොල්ල ප්‍රදේශයේදී අනතුරට ලක්වීමෙන් රු. 1,739,950ක අලාභයක් සිදුව තිබුණු අතර ඒ සඳහා රක්ෂණ සමාගමෙන් රු.555,080ක අත්තිකරම් මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණි. වාහනය අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් 2022 ජූනි 01 දින රක්ෂණ සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුමේ 08 වන වගන්තිය අනුව, මාස 03ක් ඇතුළත අලුත්වැඩියාව සම්පූර්ණ කිරීමට නොහැකි වන්නේ නම් ප්‍රමාදයට හේතු ලිඛිතව දන්වන ලෙසත්,එසේ සිදු කිරීමට අපොහොසත් වුවහොත් ගොනුව වසා දැමීමට සිදුවන බවත් සඳහන් කර තිබුණි. අලුත්වැඩියාව සඳහා මාස 03කට වැඩි කාලයක් ගතවන බව රක්ෂණ සමාගම වෙත ලිඛිතව දැනුවත් නොකිරීම හේතුවෙන් රක්ෂණ හිමිකමේ ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි බව රක්ෂණ සමාගම විසින් 2024 ජනවාරි 11 දිනැති ලිපිය මඟින් දන්වා තිබූ අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 දෙසැම්බර් 30 දින රු.1,184,870 ක් වැයකර වාහනය අලුත්වැඩියා කර තිබූ අතර ඉතිරි රක්ෂණ මුදල ලබා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

### 4.6 අනාර්ථික ගනුදෙනු

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරන ලද නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ පිළිවෙලින් රු. 1,600,000 ක් හා 1,200,000ක් වශයෙන් ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් දෙදෙනකු අධි අවධානම් ස්ථාන වලම තවදුරටත් රැඳී සිටින බව නිරීක්ෂණය විය.

### 4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2024 ජන හා නිවාස සංගණනය වෙනුවෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ටැබ්ලට් පරිගණක හා උපාංග ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත් කිරීම සම්බන්ධයෙන් වන ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 ජූනි 01 දිනැති අංක මු.ගි./10/23/5T/11 දරණ ලිපිය මඟින් මුදල් රෙගුලාසි 804(1) ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. තාවකාලිකව ලද ටැබ්ලට් පරිගණක, ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත් කර තිබූ අතර ටැබ්ලට් පරිගණක 36 හි වටිනාකම රු. 561,600 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිගාස් පද්ධතියට ගිණුම් ගතකර තිබීමෙන් ස්ථාවර වත්කම් වටිනාකම රු. 561,600 කින් අධි තක්සේරු වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් විසින් විශ්‍රාමිකයින් 51 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප්රු.16,733,144කින් රු.12,109,326ක් 2025 දෙසැම්බර් 31 වන විට තවදුරටත් අයකරගත යුතුව පැවතුණි.

5. යහපාලනය

5.1. මහජනයා වෙත සේවා ඉටු කිරීම /මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත් ඉල්ලුම්කරුවන් වෙත අයදුම්පත්‍ර නිකුත් කිරීමේදී ග්‍රාම නිලධාරීන් විසින් ඉල්ලුම්කරුවන් වෙතින් ලබා ගන්නා ඉල්ලුම්පත්‍ර හා ඒවාට අදාළ ගාස්තුද සමඟ දින 10ක් තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදීම අනිවාර්ය බව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ අංක DRP/OP/01/DS/03 (වෙළුමIV)හා 2023 නොවැම්බර් 11 දිනැති ලිපිය අනුව දන්වා තිබුණි. බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 03 කට අදාළව අවස්ථා 28 ක දී හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාළ ඉල්ලුම්පත් ගාස්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත භාර දීමේදී දින 14 සිට මාස 03ක් දක්වා කාල ප්‍රමාදයන් පැවති අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම්වල පවතින ජීවිත හා දේපළවලට අනතුරුදායක තත්ත්වයෙන් පවතින ගස් ඉවත් කිරීමට ග්‍රාම නිලධාරී වසම් 08කට අදාළව යොමුකර තිබූ ඉල්ලීම් 11ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාවලිය තුළ ග්‍රාම නිලධාරී වාර්තාව ලබාදීමට සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදුවීම හේතුවෙන් මහජනයා වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය විය.

**6. මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්යමණ්ඩලය, තථ්‍ය කාර්යමණ්ඩලය**

2025 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 236ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 355 ක් විය.

| සේවා වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 81 | 63 | 18 | - |
| තෘතියික මට්ටම | 63 | 36 | 27 | - |
| ද්විතියික මට්ටම | 1,859 | 2,027 | 180 | 352 |
| ප්‍රාථමික මට්ටම | 145 | 146 | 11 | 03 |
| එකතුව | 2,148 | 2,272 | 236 | 355 |

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී.මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

පිටපත් - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

# කාර්යසාධන දර්ශක

## **4.1** ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

# 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

**ඉංජිනේරු අංශය**

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම |
|---|---|

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| ඇස්තමේන්තු ක්‍රියාත්මක වීම | √ | | | |
| අදාළ මූල්‍ය වාර්තා අනුව කටයුතු සිදු වීම | √ | | | |
| අදාළ තාක්ෂණික වාර්තා අනුව කටයුතු සිදු වීම | √ | | | |
| එම වැඩසටහන් ඵලදායි ලෙස ක්‍රියාත්මක වීම | √ | | | |
| එම ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යන වාර්තාවලට අනුව ක්‍රියාත්මක වීම | √ | | | |
| ව්‍යාපෘතිය සිදු කළ පසු පසු විපරමක් වීම | √ | | | |
| භෞතික සම්පත් සහ මානව සම්පත් අනාගතය වෙනුවෙන් ආරක්ෂා වීම | √ | | | |
| ව්‍යාපෘතිය නිසි ආකාරයෙන් නිම වීම | √ | | | |
| රාජ්‍ය වියදම් නිසි අයුරින් කළමනාකරණය වීම | √ | | | |
| යටිතල පහසුකම් කළමනාකරණය විධිමත්ව සිදු වීම | √ | | | |
| යටිතල සම්පත්, මූල්‍ය සම්පත්, මානව සම්පත්, නිවැරදිව යොදා ගත් බවට සහතිකයක් ලැබීම | √ | | | |

| | | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| කාබනික පොහොර නිෂ්පාදකයින් හා මිල දී ගන්නන් අතර මනා සම්බන්ධීකරණයක් සිදු වීම, ගොවීන්ට ගුණාත්මක භාවයෙන් යුතු පොහොර ලැබීම හා දේශීය කර්මාන්ත බිහි වීමෙන් නව ව්‍යවසායකයින් බිහි වීම | | | | √ |
| පොහොර බෙදා හැරීම නිවැරදිව සිදු වනවා දැයි නීති පරීක්ෂා වීම හා ගබඩා තොරතුරු නිවැරදිභාවය පිළිබඳව තහවුරු වීම හා පොහොර අවශ්‍යතාවය දිස්ත්‍රික් මට්ටමින් තක්සේරු වීම හා සැලසුම් වීම | | | | √ |
| රසායනාගාර නියැදි වාර්තා අනුව ලියාපදිංචි සිදු වීම හා ඉහළ ගුණාත්මක තත්වයේ, ඉහළ පරිසර හිතකාමී පොහොර ගොවීන් වෙත ලැබීම සඳහා අවශ්‍ය තත්ත්ව සහතිකය ලැබීම | | | | √ |
| අදාළ කරුණු කාරණා පිළිබඳ සාකච්ඡාවට භාජනය වීම නිසා කාලීනව තීන්දු තීරණ ගැනීම සිදු වීම | | | | √ |

## සමාජ ආරක්ෂණ අංශය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|

| | සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා සාමාජික වූ අයගේ සැඳෑ සමය ආර්ථික වශයෙන් සුරක්ෂිත වීම සහ විශ්‍රාම වැටුප්ලාභීන් බවට පත්වීම. | √ | | | |
| සැඳෑ සමයට පෙර මුහුණ දීමට සිදු වන අබලතා හා මරණ සඳහා මූල්‍ය ප්‍රතිලාභ ලැබීම. | √ | | | |
| දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහය ලැබීම. | √ | | | |

## වනිතා කටයුතු

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| ක්‍රියාකාරි බදුල්ල දිස්ත්‍රික් SGBV දිස්ත්‍රික් කමිටුවක් බිහි වීම | √ | | | |
| අවදානම් පවුල් හඳුනා ගැනීමට හැකි වීම හා ගැටළු ඇති වීම අවම වීම | √ | | | |
| දිස්ත්‍රික්කයට ගැළපෙන, ප්‍රායෝගික වැඩසටහනක් හඳුනා ගැනීමට හැකි වීම | √ | | | |
| ගැළපෙන, ප්‍රායෝගික වැඩසටහනක් හඳුනා ගැනීම හා පැවැත්වීමට හැකි වීම | √ | | | |
| කාන්තාවන් සයිබර් අපරාධවලට ගොදුරු වීම අඩු වීම | √ | | | |
| නිවැරදි දත්ත පද්ධතියක් ඇතිවීම | √ | | | |
| වැවිලි ක්ෂේත්‍රයේ  කාන්තාවන් හා දරුවන්ගේ ගැටළු අඩු වීම | √ | | | |
| පවුලේ පෝෂණ මට්ටම ඉහළ යාම | √ | | | |

## විදේශ රැකියා ඒකකය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම |
|---|---|

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| විදේශ ගත ශ්‍රමිකයන් සඳහා දිස්ත්‍රික් විගමනික කමිටුවක් ක්‍රියාත්මක වීම | √ | | | |
| විදේශගත ශ්‍රමිකයන්ගේ පවුල්වල ආර්ථිකය ශක්තිමත් වීම | √ | | | |
| ශ්‍රමිකයන්ගේ පවුල්වල දරුවන් අධ්‍යාපනය සඳහා අභිප්‍රේරණය වීම | √ | | | |
| මෙරටට පැමිණි ශ්‍රමිකයන්ගේ ආදායම් වැඩි වීම හා ආර්ථික ස්ථාවරත්වය වැඩි වීම | √ | | | |

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| ශක්තිමත් ගෘහ ඒකකයක් ඇති වීම | | √ | | |
| ජාතික නිෂ්පාදනයට දායක වීමට හැකි වීම | | √ | | |
| අඩු ආදායම් ලාභීන් සවි බල වීම | | √ | | |
| ශක්තිමත් ආරක්ෂණ ජාලයක් සහතික වීම | | √ | | |
| සුරක්ෂිත නිවසක හිමිකම ලැබීම | | √ | | |
| සුරක්ෂිත ගෘහ පරිසරයක් ඇති වීම | | √ | | |
| ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රජාව තුල ඇති වීම | | √ | | |
| සුරක්ෂිත පාරිසරික වටපිටාවක් ඇති වීම | | √ | | |
| ආහාර සුරක්ෂිතතාවය ඇති වීම | | √ | | |
| ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ ජයග්‍රහණ හිමි වීම | | √ | | |
| ආර්ථිකය ශක්තිමත් හා සෞඛ්‍ය සම්පන්න පවුල් පරිසරයක් ඇති වීම | | √ | | |
| අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ගේ පාසල් අධ්‍යාපන අවශ්‍යතා පූර්ණ වී තිබීම | | √ | | |

## මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය

| | | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| මිනුම් මත පදනම් වූ සේවා හා නියාමන ක්‍රියාකාරකම් වල යෙදෙමින් නිෂ්පාදකයන් වෙළෙන්දන් හා පාරිභෝගිකයන්ගේ සමානත්වය හා යුක්තිය තහවුරු කිරීම | | | | √ |
| නියමිත බරින් යුතු භාණ්ඩ පාරිභෝගිකයාට ලබා දී මනා සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා විශ්වසනීය මිනුම් හා ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා රැක ගනිමින් ජීවන තත්ත්වය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම | | | | √ |
| මිනුම් මත පදනම් වූ සේවා හා නියාමන ක්‍රියාකාරකම් වල යෙදෙමින් නිෂ්පාදකයන් වෙළෙන්දන් පාරිභෝගිකයන්ගේ සමානත්වය හා යුක්තිය තහවුරු කිරීම | | | | √ |

## රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ කටයුතු

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| NGO ව්‍යාපෘති මඟින් දිස්ත්‍රික්කයේ ජනතාවට ලැබෙන ප්‍රතිලාභ වැඩි වීම | √ | | | |
| දිස්ත්‍රික්කයේ ජනතාවට අදාළ ව්‍යාපෘති මඟින් බලාපොරොත්තු ඉලක්ක සැපිරීම | √ | | | |
| සංවිධානවල ඉලක්ක වෙත යොමු වීම හා ඒ තුලින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම | √ | | | |

## ඵලදායිතා ඒකකය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| සාර්ථක වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් | | | | √ |

| | | | | |
|---|---|---|---|---|
| වැඩිදියුණු වූ රාජ්‍ය අංශය සඳහා ක්‍රියාවලි ප්‍රමාණය | | | | √ |
| 5 එස් සහතිකකරණ ලබා ගැනීම | | | | √ |
| සහභාගී වූ පුහුණු ප්‍රමාණය | | | | √ |
| ඉටු කල වැඩසටහන් ප්‍රමාණය | | | | √ |

## ආපදා කළමනාකරණ අංශය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| හදිසි අවස්ථාවක දී වඩා කාර්යක්ෂම ලෙස රෝහල තුළ ප්‍රතිචාර දැක්වීම හා මිය යන රෝගීන්ට ඉක්මන් ප්‍රතිකාර ලැබීම | √ | | | |
| අඛණ්ඩ ජල සැපයුම තිරසාර කිරීම හා පරිසර සමතුලිතතාව ආරක්ෂා කිරීම | √ | | | |
| පාසල් දරුවන් හා ගුරු භවතුන් මගින් හදිසි ආපදා ප්‍රතිචාර සාර්ථකව කර ගැනීමට හැකියාව ලැබීම | √ | | | |
| ග්‍රාමීය අවදානම් තත්ත්ව හඳුනා ගැනීමට හැකියාව ලැබීම, පූර්ව දැනුම්දීමේ ක්‍රමවේදයන්ට අනුගත වීම, සාර්ථක ප්‍රතිචාර දැක්වීම සඳහා ධාරිතා සංවර්ධනය වැඩි වීම | √ | | | |
| සාර්ථක ලෙස අවදානමෙන් ඉවත් වීම හා ප්‍රතිචාර දැක්වීමට හැකි වීම | √ | | | |
| පාසල් ප්‍රජාවගේ ධාරිතා වර්ධනය | √ | | | |
| නායයෑම් අවදානමේ ප්‍රජාවගේ අවදානම අවම වීම | √ | | | |
| සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීමට හැකියාව වීම | √ | | | |
| ග්‍රාමීය ප්‍රජාවට බලපාන අවදානම අවම වීම | √ | | | |
| දේශගුණික අවදානම අවම වීම | √ | | | |
| පාසල් ප්‍රජාවට බලපාන අවදානම අවම වීම | √ | | | |
| වාර්ෂිකව ඇති වන කැලෑ ගිනි ප්‍රමාණය අවම වීම | √ | | | |
| ආපදා හා ආපදා අවදානම ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ධනාත්මක ආකල්ප සංවර්ධනය වීම | √ | | | |
| ළමා නිවාස දරුවන්ගේ අවදානම අවම වීම | √ | | | |
| වැඩිහිටි නිවාසවල වාසය කරන්නන්ගේ අවදානම අවම වීම | √ | | | |
| මාර්ග අනතුරු අවදානම අවම කිරීම තුළින් ජීවිත හානිය අවම වීම | √ | | | |

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට හා අවදානම අවම වීම තහවුරු වීම | √ | | | |
| 2026 වර්ෂය සඳහා ව්‍යාපෘති අනුමත වීම | √ | | | |
| හදිසි ආපදා ප්‍රතිචාර ඵලදායී සහ කාර්යක්ෂම වීම | √ | | | |

## නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් අංශය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| පාඨමාලා හදාරා රැකියා ගත වීම | √ | | | |
| සුදුසු පාඨමාලා හැදෑරීම | √ | | | |
| අනාගත වැඩ ලෝකය ජය ගැනීම | √ | | | |
| රැකියා ගත වීම ඉහළ යාම | √ | | | |
| වැඩ ලෝකයට නිපුණ ශිල්පීන් බිහි වීම හා විරැකියාව අවම වීම | √ | | | |

## බෞද්ධ කටයුතු

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| දිස්ත්‍රික්කයේ බෞද්ධ කටයුතුවල පුනර්ජීවනයක් ඇති වීම | √ | | | |

## ඉඩම් පරිහරණ සැලසුම් අංශය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| සංවේදී ප්‍රදේශ සංරක්ෂණය වීම | √ | | | |
| ප්‍රශස්ථ ඉඩම් පරිහරණය තහවුරු වීම | √ | | | |

| | | | | |
|---|---|---|---|---|
| ග්‍රාමීය සංවර්ධනය සහ ක්ෂුද්‍ර ජල පෝෂකවල තිරසාර පැවැත්ම තහවුරු වීම | √ | | | |
| ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය වීම | √ | | | |
| මනා ඉඩම් සැලසුම්කරණයක් සිදු වීම | √ | | | |

## කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |
| නව ව්‍යාපාර ආරම්භ කිරීම | √ | | | |
| අධ්‍යාපනය නිමා කිරීමෙන් පසු ස්ව ශක්තියෙන් නැඟී සිටීම සඳහා ව්‍යාපාරයක් ආරම්භ කිරීම | √ | | | |
| කඩා නොවැටී ව්‍යාපාරයක් ඉදිරියට පවත්වා ගෙන යාම | √ | | | |
| සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීම | √ | | | |
| නවීන ව්‍යාපාර ආරම්භ කිරීම | √ | | | |
| පවතින ව්‍යාපාර සංවර්ධනය කිරීම | √ | | | |
| නව ව්‍යාපාර ආරම්භ කිරීම/පවතින ව්‍යාපාර සංවර්ධනය කිරීම | √ | | | |
| පවතින ව්‍යාපාර සංවර්ධනය කිරීම | √ | | | |
| දිස්ත්‍රික්කයේ ග්‍රාමීය කෘෂි හා ආර්ථික තත්ත්වය ඉහල යාම | √ | | | |

## ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50% වඩා අඩු |

| | | | | |
|---|---|---|---|---|
| සේවාලාභීන්ට කාර්යක්ෂමව හා සමානතාවයෙන් සේවා ලැබීම, සේවය ත්‍රෛභාෂාවෙන් සැපයීම, සේවාලාභීන් තුල රාජ්‍ය සේවය පිළිබඳ ව විශ්වාසයක් ඇති වීම | √ | | | |

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ

# කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| දිළිඳුකම තුරන්කිරීම | අස්වැසුම ප්‍රතිලාභ පුද්ගලයන් 129,459 දෙනෙකු වෙත ලබා දීම | 1.1 | | | ✔ |
| | උරුමය වැඩසටහන යටතේ ඉඩම් ඔප්පු 22ක් ලබා දීම | 1.4 | | ✔ | |
| | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම | 1. a | | | ✔ |
| | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බීජ අර්තාපල් නිශ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 1. a | | | ✔ |
| ආහාර සුරක්ෂිතතාවය | විමධ්‍යගත අයවැය වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන, වැවිලි ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන, වතු ප්‍රදේශවල පවතින ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සහ සංචාරක සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති සංවර්ධන ව්‍යාපෘති 333ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම | 2.a | | | ✔ |
| | පෝෂණය සඳහා වන බහු ආංශික සැලැස්ම ක්‍රියාත්මක කිරීම | 2.a | | | ✔ |
| | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බීජ අර්තාපල් වගා කිරීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම | 2.a | | | ✔ |
| පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව | ප්‍රජා ආශ්‍රිත ජල පෙරණ පද්ධති 54 පවත්වා ගෙන යාම | 6.3 | | | ✔ |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම | විමධ්‍යගත අයවැය වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන, වැවිලි ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන, වතු ප්‍රදේශවල පවතින ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සහ සංචාරක සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති සංවර්ධන ව්‍යාපෘති 333ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම | 9.1 | | | ✔ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක කර දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතාවය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් වූ කාලය පැවති අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් ප්‍රමාණවත් නොවීම සහ සිදු කරන ලද සංවර්ධන කාර්යයන් දිටිවා ව්‍යසනය හේතුවෙන් විනාශයට පත් වීම.

# 06 පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

6.3 මානව සම්පත් සංවර්ධනය

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 17 | 12 | 05 | - |
| තෘතීයික | 04 | 03 | 01 | - |
| ද්විතීයික | 75 | 95 | - | 20 |
| ප්‍රාථමික | 30 | 31 | - | 01 |
| එකතුව | 126 | 141 | 06 | 21 |

## 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

ආයතනයේ පැවතිය යුතු කාර්ය මණ්ඩලය ආයතනය මඟින් සිදු කෙරෙන කාර්යයන් ප්‍රමාණය මත තීරණය කර අවශ්‍ය සේවක ගණය හා සංඛ්‍යාව පවත්වා ගෙන යනු ලබයි. ඒ අනුව,කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති කාර්ය මණ්ඩල වාර්තාව අනුව කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යනු ලබයි. එහෙත් ඇතැම් සේවා ගණ සඳහා කාර්ය මණ්ඩල ඌණතාවයන් මෙන්ම ඇතැම් සේවා ගණ සඳහා කාර්ය මණ්ඩල අතිරික්තයන් පවතී. මේ බොහෝ විට හේතු වන්නේ ප්‍රාදේශීය දුෂ්කරතා, ප්‍රියමනාප සේවා ස්ථාන හා අනෙකුත් සමාජයීය පහසුකම් යනා දී කරුණු වේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය රු. (දේශීය) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| සිගාස් පුහුණු වැඩසටහන | 70 | 1 | 304,750.00 | දේශීය | 100% |
| වෙබ් අඩවි සකස් කිරීම හා යාවත්කාලීන කිරීම | 75 | 1 | 111,300.00 | දේශීය | 100% |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පුහුණුව | 80 | 1 | 43,746.00 | දේශීය | 100% |
| PL කාණ්ඩයේ නිලධාරීන් පුහුණු කිරීම | 120 | 2 | 58,150.00 | දේශීය | 100% |
| තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත | 100 | 1 | 31,000.00 | දේශීය | 100% |
| රාජ්‍ය තොරතුරු දත්ත පද්ධතිය හා පරිගණක යෙදවුම් සයිබර් ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කිරීම | 100 | 1 | 98,380.00 | දේශීය | 100% |
| සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන | 40 | 1 | 33,910.00 | දේශීය | 100% |
| සංචාරක වාර්තාමය වැඩසටහන් හා ඡායාරූපකරණය | 40 | 1 | 8,500.00 | දේශීය | 100% |
| ආතති කළමනාකරණය (ද්විතීක නිලධාරීන්) MSO/DO/EDO/GS | 135 | 2 | 185,288.76 | දේශීය | 100% |
| ආතති කළමනාකරණය (මාණ්ඩලික නිලධාරීන්) ACC/ADP/AO/AGN | 40 | 2 | 256,985.00 | දේශීය | 100% |
| ආතති කළමනාකරණය (මාණ්ඩලික නිලධාරීන්) DS/ADS | 35 | 2 | 368,480.00 | දේශීය | 100% |

**ආයතනයේ කාර්යය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය**

| අනු අංකය | පුහුණු වැඩසටහන | ආයතනයේ කාර්යය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය |
|---|---|---|
| 1 | සිගාස් පුහුණු වැඩසටහන | 90$ |
| 2 | වෙබ් අඩවි සකස් කිරීම හා යාවත්කාලීන කිරීම | 70% |
| 3 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පුහුණුව | 85% |
| 4 | PL කාණ්ඩයේ නිලධාරීන් පුහුණු කිරීම | 85% |
| 5 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත | 90% |
| 6 | රාජ්‍ය තොරතුරු දත්ත පද්ධතිය හා පරිගණක යෙදවුම් සයිබර් ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කිරීම | 92% |
| 7 | සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන | 80% |
| 8 | සංචාරක වාර්තාමය වැඩසටහන් හා ඡායාරූපකරණය | 75% |
| 9 | ආතති කළමනාකරණය (ද්විතීක නිලධාරීන්) MSO/DO/EDO/GS | 90% |
| 10 | ආතති කළමනාකරණය (මාණ්ඩලික නිලධාරීන්) ACC/ADP/AO/AGN | 90% |
| 11 | ආතති කළමනාකරණය (මාණ්ඩලික නිලධාරීන්) DS/ADS | 90% |

# 07 පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම ( වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩි නඩි ලේඛන / පුද්ගල පඩි නඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.5 | සියලු ම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනයට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අදාළ නොවේ. | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුල දැනුවත් කිරීම. | අනුකූල වේ. | | |
| 3.3 | ආයතනය තුල සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළු ම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාර ව සියලු ම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලු ම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුල පවත්වා ගෙන තිබීම. | අනුකූල වේ. | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නොවේ . | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාළ නොවේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතු ව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නො ඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කළ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කොට සෘජුව ම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළු ම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනත 8 වන හා 10 වන වගන්ති ප්‍රකාර ව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල නොවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක වේ. | |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල නොවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක වේ. | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |